*සැ. යු.* - (i) 2021.10.22 දින පළ කරන ලද අංක 2251 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,252 - 2021 ඔක්තෝබර් මස 29 වැනි සිකුරාදා - 2021.10.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |

| | පිටුව |
|---|---|
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 568 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 569 |


*සැ. යු.*- (i) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(ii) කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(iii) සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 නොවැම්බර් මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 නොවැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මාතර දිසා අධිකරණයේ දී ය

*නඩු අංකය* : එම්. බී. 2881
*ස්වභාවය* : උකස්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. මිලියන 33

අකුරැස්ස කඹුරුපිටිය පාර, නව වනිගසේකර ගොඩනැගිල්ල අංක 18 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන (සීමාසහිත හැටන් නැෂනල් බැන්ක් යනුවෙන් කලින් හැඳින්වුනු) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

..............*පැමිණිලිකරු.*

*එදිරිව*

අමර මෝටර්ස් යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන, විතාරණ පතිරණ අමර, අංක 129/ඒ, දෙනියාය පාර, අකුරැස්ස.

..................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුව වර්ෂ 2016.10.28 දිනැති මාතර දිසා අධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාර විත්තිකරුගෙන් පැමිණිලිකාර බැංකුවට අයවිය යුතු රුපියල් 3,259,596.95 ක මුදලක් සහ 2012 දෙසැම්බර් මස 01 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වසරකට 20% බැගින් පොළිය ද, සහ නඩු ගාස්තු පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා විත්තිකරුට විරුද්ධව ප්‍රකාශ කරන ලද නඩු තීන්දුව ප්‍රකාර ක්‍රියා කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල් පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා මෙම නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි ආඥාවේ බලය පිට මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති විත්තිකරුට අයත් නිශ්චල දේපල **වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 11.00** ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*දේපලට පිවිසීම*.- අකුරැස්ස ප්‍රධාන බස් නැවතුම්පොලේ සිට ගොඩපිටිය අතුරලිය මාර්ගය දෙසට කිලෝ මීටර් 1 1/2 ක් පමණ ගිය විට වම් පසින් ''සුපිපි ලී මෝල'' දන්වීම් පුවරුව ඇති ස්ථානයෙන් වම් පසට ඇති වැලි පාර දිගේ මීටර් 500 ක් පමණ ඉදිරියේ වම් පසින් ඇති ''අමර මෝටර්ස්'' යනුවෙන් හැඳින්වෙන ගරාජ් ගොඩනැගිල්ල වන අදාල දේපල හමු වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ.

1. ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් දේපල මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500 සඳහා රු.150 ක ගාස්තුවක් සහ රු. 7,500 ඉක්ම වන සෑම රු. 1000 ක් සඳහාම රු. 5 බැගින් පිස්කල් ගාස්තු ගෙවිය යුතුය.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ, හොන්දුව (පානදුගම) හි පිහිටි ''ගඟඅද්දර පැලවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් මැන සකස් කරන ලද 2000.03.23 දින සහ අංක 7129 දරන පිඹුරේ ලොට් 2A දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : වැව් කණ්ඩියෙන් සහ ඉඩම්වල සිට ප්‍රධාන පාර දක්වා ඇති පාරෙන් ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 2B වලින් ද, දකුණට - බෙරෙන්ඩිගොඩවත්ත සහ ඉහළගේවත්තෙන් ද සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් 1 න් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් නවයයි දශම තුනයි තුන (අ. 0, රූ.01, පර්. 9.33) හෝ හෙක්ටයාර් බින්දුවයි දශම එකයි දෙකයි හතරයි හත (හෙක්.0.1247) ක් විශාල අංක 7129 දරන පිඹුරට අයත් ඉඩම සහ ඒ තුළ ඇති ගහකොළ ගොඩනැගිලි සහ අනිකුත් සියලු දේත් සමඟ මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C662/183 යටතේ ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

සමන්තිකා විතානගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, මාතර.

2021 ඔක්තෝබර් මස 11 වැනි දින දී ය.

10-411

# විවිධ දැන්වීම්

## ශ්‍රී සීලානන්ද පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

අජිත් රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී සීලානන්ද පදනම" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

01. සිසුන්ට අධ්‍යාපනය, ක්‍රීඩා සහ කලා කටයුතුවලට උපකාර කිරීම ;

02. මානව සුභසිද්ධිය සඳහා සහාය වීම සහ උපකාර කිරීම ;

03. රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීමට,

යනාදිය වේ.

අජිත් රාජපක්ෂ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

10-456

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.